“ඔබ නැගිට සලාතය ඉටු කරන්න. නමුත් ඔබට නොහැකි නම් වාඩි වී ඉටු කරන්න. එයට ද නොහැකි නම් ඉල පැත්තට ඇළවී ඉටු කරන්න.” යැයි පැවසූහ

ඉම්රාන් ඉබ්නු හුසෙයින් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී. මට අර්ශස්
රෝගය හට ගෙන තිබිණ. එවිට මම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාගෙන් සලාතය
පිළිබඳ විමසා සිටියෙමි. එවිට එතුමාණෝ: “ඔබ නැගිට සලාතය ඉටු කරන්න. නමුත් ඔබට
නොහැකි නම් වාඩි වී ඉටු කරන්න. එයට ද නොහැකි නම් ඉල පැත්තට ඇළවී ඉටු කරන්න.” යැයි පැවසූහ.
[صحيح] [رواه البخاري]

සලාතයේ මූලික ක්රියාවලිය, නැගිට සිට එය ඉටු කිරීම බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ පැහැදිලි කළහ. නමුත් කිසිවකුට හෝ ඒ සඳහා හැකියාව නැති අවස්ථාවක ඔහු වාඩි වී සලාතය ඉටු කරයි. වාඩි වී සලාත් ඉටු කිරීමට නොහැකි වූයේ නම් ඔහුගේ ඉල පැත්තට ඇළවී සලාතය ඉටු කිරීමේ හැකියාව ඔහුට ඇත.

https://sunnah.global/hadeeth/si/show/10951